# ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ ගැසට් පත්‍රය

## අති විශෙෂ

**අංක 1979/44 - 2016 අගෝස්තු මස 12 වැනි සිකුරාදා - 2016.08.12**

(රජයේ බලයපිට ප්‍රසිද්ධ කරන ලදී)


# III වැනි කොටස - ඉඩම්

## ඉඩම් රජයට ගැනීම පිළිබඳ දැන්වීම්

**ඉඩම් අත්කර ගැනීමේ පනත (460 වැනි පරිච්ඡේදය)**

7 වැනි වගන්තිය යටතේ දැන්වීම

*මගේ අංකය.*: 6/3/7/15/07/03.
*ඉඩම් අමාත්‍යාංශයේ යොමු අංකය.*: LD/05/2007/MV/118C.

මහජන කටයුත්තක් සඳහා අවශ්‍ය පහත දැක්වෙන ඉඩම ලබා ගැනීමට ආණ්ඩුව අදහස් කරන බැව්, 1964 අංක 28 දරණ ඉඩම් අත්කර ගැනීමේ (සංශෝධන) පනතින් සංශෝධිත පරිදි ඉඩම් අත්කර ගැනීමේ පනතේ 7 වැනි වගන්තියේ (1) වැනි උපවගන්තිය යටතේ මෙයින් දැනුම් දී සිටිමි.

*ලබා ගැනීමට බලාපොරොත්තු වන ඉඩමේ විස්තරය* :-

මෙහි මහජන කටයුත්තක් යනු මොරගහකන්ද හා කළුගඟ සංවර්ධන ව්‍යාපෘතිය සඳහා ඉඩම් අත්පත් කර ගැනීම වේ.

මධ්‍යම පළාතේ මාතලේ දිස්ත්‍රික්කයේ නාඋල ප්‍රාදේශීය ලේකම් කොට්ඨාසයේ, ගහල පල්ලේසිය පත්තුවේ මැදපිහිල්ල ග්‍රාම නිලධාරී වසමේ මැදපිහිල්ල ගමේ පිහිටි සර්වේයර් ජනරාල් විසින් 2013.05.22 දින සම්මත කරන ලද, අ.හු.පි. අංක 17හි, අතිරේක අංක 23 හි, පත්‍ර අංක 70 දරන සැලැස්මේ පෙන්නුම් කර ඇති පහත විස්තර සඳහන් ඉඩම්.

01. **කැබලි අංක 3126**
ඉඩමේ නම: කැන්දගොල්ල; විස්තරය: ළඳු කැලය; හිමිකම් කියන අය: රජය; ඉඩම් ප්‍රමාණය: හෙක්ටයාර් 0.0835.

02. **කැබලි අංක 3167**
ඉඩමේ නම: කැන්දගොල්ල; විස්තරය: ළඳු කැලය; හිමිකම් කියන අය: රජය; ඉඩම් ප්‍රමාණය: හෙක්ටයාර් 0.3551.

03. **කැබලි අංක 3168**
ඉඩමේ නම: කැන්දගොල්ල; විස්තරය: ගෙවත්ත; හිමිකම් කියන අය: රජය; ඉඩම් ප්‍රමාණය: හෙක්ටයාර් 1.1989.

ඉහත සඳහන් ඉඩමට හිමිකම්, අයිතිවාසිකම් හෝ වෙනත් සම්බන්ධකම් කියා සිටින සියලු දෙනාම තම තමන් හෝ ඔවුන්ගේ ලියවිලිවලින් බලයලත් අයවලුන් හෝ 2016 අගෝස්තු මස 25 වැනි දින පූ. හා. 9.00ට නාඋල ප්‍රාදේශීය ලේකම් කාර්යාලයේ දී මා සම්මුඛ විය යුතු ය.

තව ද, 2016 අගෝස්තු මස 18 වැනි දිනට මත්තෙන් ඒ ඉඩම/ඉඩම් සම්බන්ධයෙන් ඔවුන්ගේ අයිතිවාසිකම්වල ස්වභාවයත්, එකී ඉඩම ලබාගැනීම ගැන වන්දි ඉල්ලීමට ඇති කරුණු පිළිබඳ විස්තරත්, වන්දි මුදල හා ඒ මුදල ගණන් බැලූ හැටිත් මා වෙත පිටපත් දෙකක් සහිත වූ ලියවිල්ලකින් දැනුම් දිය යුතුයි.

ඩී. ආර්. බී. එන්. බී. කරුණාතිලක,
ප්‍රාදේශීය ලේකම්,
නාඋල.

2016 අගෝස්තු මස 05 වැනි දින,
නාඋල ප්‍රාදේශීය ලේකම් කාර්යාලයේ දී ය.

08—798

.


*මෙම අති විශෙෂ ගැසට් පත්‍රය* www.documents.gov.lk *වෙබ් අඩවියෙන් බාගත කළ හැක.*



1A - G 24019 - 32 - (2016/08)

ශ්‍රී ලංකා රජයේ මුද්‍රණ දෙපාර්තමේන්තුවේ මුද්‍රණය කරන ලදී.